{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අ.පො.ස. උසස් පෙළ පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2026
க.பொ.த. உ/த முன்னோடி மாதிரி வினாப் பத்திரம் - 2026
G.C.E. A/L Pre-Model Model Question Paper - 2026

බුද්ධ ධර්මය - I
பௌத்தம் - I
Buddhism - I

41 S I

කාලය : පැය 02
நேரம் : 02 மணித்தியாலம்
Time : 02 Hours

- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නවලට (1), (2),(3),(4),(5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත්ම ගැළපෙන** පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසු පස දැක්වෙන පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 යි.

1. බුදුරජාණන් වහන්සේට සමකාලීන වූ මහණ බමුණන් කිසිවෙකුත් නොලද බුදුරජාණන් වහන්සේට ම සුවිශේෂ වූ ඤාණාධිගමයක් වන්නේ,
   1. චේතෝපරිය ඤාණය යි.
   2. සුතමය ඤාණය යි.
   3. ආසවක්ඛය ඤාණය යි.
   4. නේවසඤ්ඤානාසඤ්ඤායතනය යි.
   5. දිබ්බචක්ඛු ඤාණය යි.

2. "යහපත් කොට යෙතැයි - සුන්දර තැනට සැපතැයි...." යන බුදුගුණ අලංකාර කවියෙන් කියවෙන බුදු ගුණය වන්නේ,
   1. අරහං ය.
   2. සුගත ය.
   3. පුරිසධම්මසාරථී ය.
   4. සත්ථාදේව මනුස්සානං ය.
   5. සම්මාසම්බුද්ධ ය.

3. සච්චක වාදයට පැමිණි කල බුදුරජාණන් වහන්සේ භාවිත කළ ප්‍රශ්න විසඳීමේ ක්‍රමය නම්,
   1. ඨපනීය ක්‍රමය යි.
   2. ඒකංසව්‍යාකරණීය ක්‍රමය යි.
   3. අට්ඨුප්පත්තික ක්‍රමය යි.
   4. පටිපුච්ඡා ව්‍යාකරණීය ක්‍රමය යි.
   5. පරජ්ඣාස ක්‍රමය යි.

4. බුදුරජාණන් වහන්සේගේ ආශ්චර්යවත් මනුෂ්‍යත්වය පිළිබඳව කියවෙන සූත්‍ර දේශනාවක් වන්නේ,
   1. ද්‍රෝණ සූත්‍රය යි.
   2. අරියපරියේසන සූත්‍රය යි.
   3. කාලාම සූත්‍රය යි.
   4. මහා සීහනාද සූත්‍රය යි.
   5. පබ්බජ්ජා සූත්‍රය යි.

5. යව සහලින් ගෙවූ වේරඤ්ජාවේ වස්කාලය තුළින් නිරූපණය වන්නේ බුදුරජාණන් වහන්සේගේ කවර ගුණයක්ද?
   1. තාදී ගුණය
   2. යථාවාදී තථාකාරි ගුණය
   3. පද්මාකාර ජීවිතය
   4. සමානාත්මතා ගුණය
   5. ආශ්චර්යවත් මනුෂ්‍යත්වය

6. දේව භාෂිතයක් නොවූ බුදු දහම සත්‍ය ගවේෂණය මගින් බුදුරජාණන් වහන්සේ කරන ලද අනාවරණයකි. මෙය තහවුරු කෙරෙන සූත්‍ර දේශනාවක් වන්නේ කුමක් ද?
   1. වසල සූත්‍රය.
   2. අරියපරියේසන සූත්‍රය.
   3. පරාභව සූත්‍රය.
   4. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය.
   5. කාලාම සූත්‍රය.

7. සූත්‍ර පිටකයේ සැකැස්ම පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   1. දීඝ නිකාය වර්ග පහකින් යුක්ත ය.
   2. අංගුත්තර නිකායෙහි නිපාත විස්සකි.
   3. සීලක්ඛන්ධ වර්ගය ඇතුළත් වන්නේ සංයුත්ත නිකායෙහි ය.
   4. මජ්ඣිම නිකාය පණ්ණාසක තුනකි.
   5. කෝසල සංයුත්තය ඇතුළත් වන්නේ බුද්දක නිකායෙහි ය.

8. නිවැරදිව පිළිපැදීමෙන් කල් නොයවා ම ඕනෑම කාලයක දී ප්‍රතිඵල අත්දැකිය හැකි දහම් ගුණය කුමක් ද?
   1. අකාලික
   2. ඒහිපස්සික
   3. සන්දිට්ඨික
   4. ඕපනයික
   5. ස්වාක්ඛාත

9. ඒකක නිපාත, දුක නිපාත, තික නිපාත ආදී වශයෙන් විස්තර වන නිකාය ග්‍රන්ථය නම්,
   1. දීඝ නිකාය යි.
   2. සංයුත්ත නිකාය යි.
   3. මජ්ඣිම නිකාය යි.
   4. අංගුත්තර නිකාය යි.
   5. බුද්දක නිකාය යි.

10. ග්‍රන්ථ පහළොවකට බෙදී ගිය නිකාය කුමක් ද?
   1. සංයුත්ත නිකාය
   2. අංගුත්තර නිකාය
   3. මජ්ඣිම නිකාය
   4. දීඝ නිකාය
   5. බුද්දක නිකාය

11. බුද්ධ කාලීන භාරතීය ශ්‍රමණ ගුරුකුලවල දක්නට ලැබුණු පොදු ලක්ෂණයක් වන්නේ,
   1. නිර්මාණවාදී වීම ය.
   2. අත්තකිලමථානුයෝගී වීම ය.
   3. භාවනාව පිළිගැනීම ය.
   4. බ්‍රහ්මචාරී වීම ය.
   5. ආජීවකයන් වීම ය

12. මහා වග්ග පාලියෙහි නිස්සය ධර්ම හතරක් සඳහන් වේ. ඉන් එකක් නම්,
   1. පැවිද්දන් සමගියෙන් ක්‍රියා කළ යුතු ය යන්න යි.
   2. වැඩිහිටි භික්ෂූන්ට වතාවත් කළ යුතු ය යන්න යි.
   3. ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන්ට අනුව හික්මිය යුතු ය යන්න යි.
   4. පැවිද්ද රැක්මුල්, සෙනසුන් ඇසුරු කිරීම පිණිස ය යන්න යි.
   5. බොහෝ ජනයාගේ හිතසුව පිණිස දහම් දෙසිය යුතු ය යන්න යි.

13. දේව නිර්මාණවාදි චින්තනයේ දී ගවේෂණයට හා වීමංසනයට ඉඩක් නොලැබෙන බව දේශනා කර ඇති සූත්‍ර දේශනාව වන්නේ,
   1. බ්‍රහ්මජාල සූත්‍රය යි.
   2. තේවිජ්ජ සූත්‍රය යි.
   3. රතන සූත්‍රය යි.
   4. කාලාම සූත්‍රය යි.
   5. සිගාලෝවාද සූත්‍රය යි.

14. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා වෙතින් ප්‍රකටවන සුවිශේෂී ගුණ අතර ඤායපටිපන්න යනු,
   1. දක්ෂිණාවට සුදුසු බවයි.
   2. වැඳුම් ලැබීමට සුදුසු බවයි.
   3. ඍජු පැවතුම් ඇති බවයි.
   4. විදර්ශනා මාර්ගයට සපැමිණි බවයි.
   5. දුර සිට ගෙනවිත් පිදීමට සුදුසු බවයි.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

15. මෙලොව දිවිය අර්ථවත් කර ගැනීමට ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙන් පෙන්වා දෙන අතර මින් කුමන කරුණක් සූත්‍රයේ ඇතුළත් වේද?
    1. නිරෝගි සම්පත
    2. සීලය
    3. සමජීවිකතා
    4. පරිත්‍යාගය
    5. ඉවසීම

16. සතර පාරාජිකාවන්ගෙන් එකකට හෝ පත්වීමෙන් භික්ෂුත්වය අහිමිවෙයි. එම සතර පාරාජිකා අතරට අයත් **නොවන** ඇවතක් වන්නේ.
    1. මෛථුන සේවනය යි.
    2. අදත්තාදානය යි.
    3. සංඝභේදය යි.
    4. මිනිස් ජීවිතයක් නැති කිරීම යි.
    5. තමා තුළ නැති ආර්ය ගුණ ඇතැයි පළ කිරීම යි.

17. සියලු සත්ත්වයෝ බල රහිත වෙති, වීර්ය රහිත වෙති, හේතු ප්‍රත්‍යය රහිතව ම සත්ත්වයෝ කිළිටි ද පිරිසිදු ද වෙතියි ප්‍රකාශ කළ බුද්ධ කාලීන ශාස්තෘවරයා වන්නේ,
    1. පූර්ණකස්සප ය.
    2. මක්ඛලි ගෝසාල ය.
    3. පකුධ කච්චායන ය.
    4. උපක ආජීවක ය.
    5. සෝණදණ්ඩ බමුණා ය.

18. කල්‍යාණ මිත්තතා යනු යහපත් මිතුරු ඇසුර යි. මේ අතරට නොගැළපෙන මිතුරා වන්නේ,
    1. උපකාරක මිත්‍රයා ය.
    2. අත්ථක්ඛායි මිත්‍රයා ය.
    3. අනුප්පියභානි මිත්‍රයා ය.
    4. සමාන සුඛ දුක්ඛ මිත්‍රයා ය.
    5. අනුකම්පක මිත්‍රයා ය.

19. බුදු දහම සසර දුකින් එතෙර වීමට මඟපෙන්වන පහුරක් වැනි ය. මෙය සඳහන් සූත්‍ර දේශනාව වන්නේ,
    1. අලගද්දූපම සූත්‍රය යි.
    2. අන්ධූපම සූත්‍රය යි.
    3. බ්‍රහ්මජාල සූත්‍රය යි.
    4. කීටාගිරි සූත්‍රය යි.
    5. පටිච්ඡන්න සූත්‍රය යි.

20. දානා දි පින්කම්වල මෙන් ම ප්‍රාණඝාතා දී පාපකර්මවල ද ඵලවිපාක නැතැයි ඉගැන්වූ අජිතකේසකම්බලගේ වාදය හැඳින්විය හැක්කේ,
    1. නියතිවාදයක් ලෙස ය.
    2. ශාස්වතවාදයක් ලෙස ය.
    3. අමරාවික්ඛේපවාදයක් ලෙස ය.
    4. නාස්තිකවාදයක් ලෙස ය.
    5. පුබ්බේකතහේතුවාදයක් ලෙස ය.

21. ශාසනයේ පළමු පිරිස ලෙස පස්වග මහණුන් සඳහා ලබාදුන් පැවිදි උපසම්පදාව නම්,
    1. සරණාගමණ පැවිද්ද යි.
    2. ඕවාදපටිග්ගහණ උපසම්පදාව යි.
    3. දූතේන උපසම්පදාව යි.
    4. අට්ඨවාචික උපසම්පදාව යි.
    5. ඒහි භික්ඛු පැවිදි උපසම්පදාව යි.

22. කුසලතා අගය කිරීම අරමුණු කොට ගෙන අගතනතුරු පිරිනැමීමේ දී බහුශ්‍රැත උවැසියන් අතර අග තනතුර ලැබුයේ,
    1. බුජ්ජුත්තරා උපාසිකාව ය.
    2. සාමාවතී උපාසිකාව ය.
    3. නකුල මාතාව ය.
    4. සුජාතාව ය.
    5. විශාකා මහෝපාසිකාව ය.

23. විනය නීති පැනවීමේ මූලික අරමුණු දහයක් පාරාජිකාපාළියෙහි සඳහන් වේ. ඉන් එකක් නම්,
    1. භික්ෂු සමාජය ආරම්භ වී දිගු කලක් ගතවීම යි.
    2. පෙර බුදුවරයන් වහන්සේලා විසින් ද විනය නීති පනවා තිබීම යි.
    3. භික්ෂූන් පාලනය කර ගැනීමට පහසුවීම යි.
    4. සිල්වත් භික්ෂූන්ගේ පහසු විහරණය සඳහා යි.
    5. භික්ෂූන් අතර උගතුන් බහුල වීමයි.

24. සාංඝික ක්‍රමයේ ඇති විශේෂත්වය වන්නේ මින් කුමක් ද?
1. අවශ්‍යතාව මත පරිහරණය කිරීමට හැකිවීම යි.
2. ඕනෑම අයෙකුට කැප බවයි.
3. තනිව භුක්තිවිඳීමට හැකි බවයි.
4. අනුමැතියකින් තොරව පරිහරණය කිරීමට හැකි වීමයි.
5. පෞද්ගලික අයිතියට ගැනීම හෝ සංඝ අනුමැතියකින් තොරව දීම කළ නොහැකි වීමයි.

25. නිස සමාදන්වීම යනු,
1. සිල් සමාදන් වීම යි.
2. ගුරුවරයා යටතේ පුහුණුව ලැබීම යි.
3. නිතර ප්‍රත්‍යවේක්ෂා කිරීම යි.
4. පිරිත් දේශනා කිරීම යි.
5. පොහොය කිරීම යි.

26. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක්කේ,
1. භාණක සම්ප්‍රදාය ඇතිවීම යි.
2. නිකාය භේදයට මුල පිරීම යි.
3. කතාවත්ථුප්පකරණය සම්පාදනය වීම යි.
4. කුඩා අනු කුඩා ශික්ෂාපද පිළිබඳ ප්‍රශ්නය යටපත් වීම යි.
5. මහායාන බුදුදහම උදාවීම යි.

27. ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වූයේ බුද්ධ පරිනිර්වාණයෙන් ..... ට පසුව ය.
1. මාස 03
2. මාස 05
3. වසර 100
4. වසර 236
5. වසර 518

28. බුදුදහමේ ඉගැන්වෙන පඤ්චස්කන්ධයෙහි විඤ්ඤාණ ස්කන්ධය යන්නෙන් කියවෙන්නේ,
1. නිවැරදි අවබෝධය යි.
2. සැපදුක් ආදී වින්දනයන් ය.
3. ඉන්ද්‍රිය හා අරමුණු ආශ්‍රිත සවැදෑරුම් ඥානය යි.
4. බාහිර ලෝකය පිළිබඳ ඇති මතක ශක්තිය යි.
5. දුක් දුරුකර ගැනීමට උපදවා ගන්නා හැඟීම් ය.

29. පුද්ගල චර්යාවන්හි හොඳ-නරක දැක්වීමට බුද්ධ දේශනාවල භාවිතවන ව්‍යවහාරයක් වන්නේ,
1. සුගති-දුගති යන්න යි.
2. සංඛත-අසංඛත යන්න යි.
3. කාල-අකාල යන්න යි.
4. පින්-පව් යන්න යි.
5. සාධූ-අසාධූ යන්න යි.

30. අන්‍යොන්‍ය යුතුකම් හා වගකීම් තහවුරු කෙරෙන බෞද්ධ පිළිවෙතක් ලෙස හැඳින්විය **නොහැක්කේ**,
1. පංච ශීලය යි.
2. සිව්බඹ විහරණය යි.
3. සිව්සඟරාවත් ය.
4. සදිසා නමස්කාරය යි.
5. සතරසතිපට්ඨානය යි.

31. බුද්ධ කාලීන ආගමික ප්‍රතිපදා අතර අත්තකිලමථානුයෝගය අනුගමනය කරන ලද්දේ,
1. වෛදික බ්‍රාහ්මණ සමාජය විසිනි.
2. ජෛන නිගණ්ඨයන් විසිනි.
3. අමරාවික්ඛේපවාදීන් විසිනි.
4. චාර්වක චින්තකයන් විසිනි.
5. උච්ඡේදවාදීන් විසිනි.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

32. පුද්ගලයා විසින් නැවත නැවතත් කළ යුතු කුසල කර්ම සහ පුණ්‍ය කර්ම බුදු දහමෙහි දැක්වෙයි. ඒ අතරින් කුසල කර්මයක් වන්නේ,
    1. පින් අනුමෝදන් වීම යි.
    2. වතාවත් කිරීම යි.
    3. වැඩිහිටියන්ට සැලකීම යි.
    4. දන් දීම යි.
    5. දැඩි ලෝබයෙන් තොර වීම යි.

33. චක්කවත්ති සීහනාද සූත්‍රයෙන් හඳුනාගත හැකි සංස්ථාගත දුක හටගන්නේ සමාජය තුළ ආර්ථික, දේශපාලන, සදාචාරමය ආදී විවිධ ගැටලු මුහුකුරා යාමෙනි. එබඳු ගැටලුවක් වන්නේ,
    1. නූගත්කම යි.
    2. ජනගහන වර්ධනය යි.
    3. අකාර්යක්ෂම රාජ්‍ය පාලනය යි.
    4. රෝග පීඩාදිය පැතිර යාම යි.
    5. කුලභේදය යි.

34. බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේ බුදු බව ලබනු පිණිස වීර්ය වැඩූ රමණීය පරිසරය වර්ණනා කර ඇත්තේ,
    1. වනරෝප සූත්‍රයේ ය.
    2. මිලින්ද ප්‍රශ්නයේ ය.
    3. පට්ඨාන ප්‍රකරණයේ ය.
    4. අරියපරියේසන සූත්‍රයේ ය.
    5. පරිවාරපාළියේ ය.

35. චතුරාර්ය සත්‍යයෙහි ඇතුළත් දුක් හතරකි. එයින් දුක්ඛ ආර්ය සත්‍යයෙහි අරුත් සතරෙකි. එයට ඇතුළත් **නොවන්නේ**,
    1. පීලනට්ඨ ය.
    2. සංඛතට්ඨ ය.
    3. සංතාපට්ඨ ය.
    4. විපරිණාමට්ඨ ය.
    5. ධම්මට්ඨ ය.

36. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ආකාරයට යහපත් ගුරු සිසු සබඳතාවක් පවැත්වීම සඳහා ශිෂ්‍යා විසින් ගුරුවරයාට ඉටු කළ යුතු යුතුකමක් **නොවන්නේ**,
    1. මැනවින් සංග්‍රහ කිරීම යි.
    2. දුටු විට හුස්නෙන් නැගිටීම යි.
    3. අවශ්‍ය උපස්ථාන කිරීම යි.
    4. අවශ්‍ය කටයුතු ඉටුකර දීම යි.
    5. මැනවින් ඉගෙන ගැනීම යි.

37. දුක්ඛ සමුදයාර්ය සත්‍යය යටතේ තණ්හාවේ ප්‍රභේදයක් ලෙස දක්වා ඇති විභව තණ්හා යන්නෙහි නිවැරදි අර්ථය කුමක් ද?
    1. භවයෙන් අත්මිදීමට ඇති ආශාව යි.
    2. උච්ඡේද දෘෂ්ටිය තුළින් උපදනා තණ්හාව යි.
    3. පුනර්භවය පිළිගන්නා තැනැත්තා තුළ ඇති වන තණ්හාව යි.
    4. පස්කම් සුව විඳීමට සත්ත්වයා තුළ ඇති කැමැත්ත යි.
    5. නිත්‍යාත්මයක් ඇතැයි සැලකීමෙන් උපදනා තණ්හාව යි.

38. මධ්‍යම ප්‍රතිපදාව යනු බෞද්ධ විමුක්ති මාර්ගය යි. එහි ඇතුළත් සම්මා කම්මන්ත ය අනුව,
    1. දැහැමි රැකීරක්ෂාවල නිරත විය යුතු ය.
    2. කයින් සිදුවන අකුසල් තුනෙන් වැළකී සිටිය යුතු ය.
    3. නොකළ යුතු වෙළඳාම් නොකළ යුතු ය.
    4. රාජ්‍ය සේවයෙහි ද නිරත විය හැකි ය.
    5. උත්සාහයෙන් ධනය ඉපයිය යුතු ය.

39. ත්‍රිලක්ෂණය දක්නා තැනැත්තාගේ සුවිශේෂී චරිත ලක්ෂණයක් වන්නේ,
    1. සැදැහැවත් අයෙකු වීම යි.
    2. මහිච්ඡතාවෙන් ක්‍රියා කිරීම යි.
    3. නොඉවසිලිවන්තව ක්‍රියා කිරීම යි.
    4. ආත්මාර්ථ සාධනයට ම යොමු වීම යි.
    5. අටලෝ දහමින් කම්පා නොවීම යි.

40. තෙරුවන් කෙරෙහි අවබෝධයෙන් ඇති කර ගන්නා ශ්‍රද්ධාව නම්,
1. තෙරුවන් කෙරෙහි බලවත් පූජනීයත්වය යි.
2. තෙරුවන් ගුණ ඇදහීම යි.
3. ආකාරවති ශ්‍රද්ධාව යි.
4. ශ්‍රද්ධා භක්තිය යි.
5. අමූලිකා ශ්‍රද්ධාව යි.

41. ගෘහස්ථ ජීවිත ගත කරන බෞද්ධයන්ට පන්සිල්වලට වඩා අටසිල් උසස් යයි සලකන්නේ එමගින්,
1. ප්‍රාණඝාතාදී පවින් වැළකීම සිදුවන බැවිනි.
2. සමාජ හිතකාමියකු බිහිවන බැවිනි.
3. නිසැකව ම නිවනට ළඟාවිය හැකි බැවිනි.
4. අපිස් පැවැත්ම ප්‍රගුණ කරවන බැවිනි.
5. ධ්‍යාන අභිඥාදිය ලබා ගත හැකි බැවිනි.

42. දසරාජ ධර්මයෙහි තපස යන්නෙන් අදහස් කරන්නේ,
1. රජු මහලු වයසේ තවුසෙකු විය යුතු බවයි.
2. සිය රාජ්‍යයේ තවුසන්ට අනුග්‍රහය දැක්විය යුතු බවයි.
3. ප්‍රතිපත්තිගරුක විය යුතු බවයි.
4. ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත විය යුතු බවයි.
5. ඡන්දයෙන් අගතියට නොයා යුතු බවයි.

43. දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයේ රජු විසින් ජනතාව ආර්ථික සමෘද්ධිය වෙත යොමු කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තුනෙන් එකක් වන්නේ,
1. සාධාරණ බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යි.
2. අඩු මිලට ඉඩම් ආදිය ලබා දීම යි.
3. නොමිලේ ආහාර ලබා දීම යි.
4. විශේෂඥ උපදෙස් ලබා දීම යි.
5. වෙනත් රටවලට ජනතාව පිටත්කර යැවීම යි.

44. බෞද්ධ ඉගැන්වීම් අනුව රාජ්‍යත්වය ජන සම්මතයෙන් ප්‍රභවය වූවක් බව සඳහන් වන මූලාශ්‍රය කුමක් ද?
1. චක්කවත්ති සීහනාද සූත්‍රය
2. රාජෝපවාද සූත්‍රය
3. මහාපරිනිබ්බාන සූත්‍රය
4. කූටදන්න සූත්‍රය
5. අග්ගඤ්ඤ සූත්‍රය

45. ආලාරකාලාමාදී සමකාලීන ශ්‍රමණ පැවිද්දන්ගේ ප්‍රතිපදාව ඉක්මවා බෞද්ධ භාවනා ක්‍රමය ඉදිරි පියවරක් පෙන්වා දී ඇතැයි කිව හැක්කේ,
1. විපස්සනාව ඉගැන්වීමෙනි.
2. ඍද්ධි ප්‍රාතිහාර්ය දැක්වීමේ හැකියාව ලබා ගැනීමෙනි.
3. දිබ්බචක්ඛු ඤාණය උපදවා ගැනීමට මග පෙන්වීමෙනි.
4. කෙලෙස් යටපත් කිරීමේ මග හෙළි කිරීමෙනි.
5. අෂ්ටසමාපත්ති ලාභයට යොමුවීමෙනි.

46. සමථ භාවනාවට එළඹෙන යෝගාවචරයාට අදාළ කර්මස්ථාන හතළිහක් විසුද්ධි මාර්ගයෙහි දැක්වේ. ඉන් එකක් නම්,
1. දේවතානුස්සතිය යි.
2. දානානුස්සතිය යි.
3. කම්මානුස්සතිය යි.
4. චිත්තානුස්සතිය යි.
5. වේදනානුස්සතිය යි.

PAST PAPERS WIKI

අ.පො.ස උසස්පෙළ විභාගයට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් සඳහා Past Papers Wiki සමඟ එක්වන්න

Past Papers Wiki

47. යෝගාවචරයෙකුට නීවරණාදී කෙලෙස් යටපත් කිරීමෙන් ලබා ගත හැකි ධ්‍යාන සතරකි. එහි දෙවන ධ්‍යානය,
    1. පීති සුඛ ඒකග්ගතා සහිත ය.
    2. විතක්ක විචාර සහිත ය.
    3. විචාර පීති සුඛ ඒකග්ගතා සහිත ය.
    4. විතක්ක විචාර පීති සුඛ සහිත ය.
    5. සුඛ ඒකග්ගතා සහිත ය.

48. බුදු දහම අනුව රාජ්‍ය පාලනය කළ යුත්තේ දසරාජ ධර්මයෙනි. එහි "අජ්ජවං" යන රාජධර්මයෙන් අදහස් වන්නේ,
    1. පරිත්‍යාගශීලි වීම ය.
    2. අවංකව ක්‍රියා කිරීම ය.
    3. මුදු මොලොක් ආකල්ප ඇති බව ය.
    4. ධනෝපායනයට උපකාර කිරීම ය.
    5. ජනතාවට ආරක්ෂාව ලබා දීම ය.

49. සතර සතිපට්ඨානයේ චිත්තානුපස්සනාව තම සිත තමා විසින් ම දැකීමට අදාළ ආකාර සොළසක් උගන්වන අතර ඉන් එකක් නම්,
    1. නීවරණ ධර්මයන් තමා තුළ ඇති බව මෙනෙහි කිරීම යි.
    2. ශරීරය දෙතිස් කුණපයකින් යුක්ත බව තේරුම් ගැනීම යි.
    3. සතර ඉරියව්වෙහි ම සිහිනුවණ ඇති කර ගැනීම යි.
    4. මහග්ගත සිත මහග්ගත යැයි දැන දැක ගැනීම යි.
    5. විඳිනු ලබන වේදනාවන් ඇති සැටියෙන් දැකීමයි.

50. මෛත්‍රී භාවනාව වඩන්නෙකුට පරලොව වශයෙන් ලැබෙන ආනිශංසය වන්නේ,
    1. නොමුලාව කලුරිය කිරීම යි.
    2. මරණින් මතු බඹ ලොව උපත ලැබීම යි.
    3. ධනධාන්‍යාදී සැප සම්පත් ලැබීම යි.
    4. උසස් ප්‍රඥාවන්තයෙකු වීම යි.
    5. රුවින් අගතැන්පත් වීම යි.

* * *

{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අ.පො.ස. උසස් පෙළ පෙරහුරු ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 2026
க.பொ.த. உ/த முன்னோடி மாதிரி வினாப் பத்திரம் - 2026
G.C.E. A/L Pre-Model Model Question Paper - 2026

බුද්ධ ධර්මය - II
பௌத்தம் - II
Buddhism - II

41 S II

කාලය : පැය 03 මිනිත්තු 10
நேரம் : 03 மணித்தியாலம் 10 நிமிடம்
Time : 03 Hours and 10 minutes

- පළමු කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, දෙවන කොටසින් ප්‍රශ්න **තුනක්** ද, තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1.
   i. පසළොස් චරණ ධර්ම අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
   ii. මහා කරුණාව නිර්වචනය කරන්න. (ලකුණු 4)
   iii. චතුර් වෛශාරද්‍ය ඥාන විස්තර කරන්න. (ලකුණු 6)
   iv. බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ඨ දේශනා විලාස හා ඉගැන්වීම් ක්‍රම අගයන්න. (ලකුණු 8)

2.
   i. "කිං සච්ච ගවේසි..." යන්න නිර්වචනය කරන්න. (ලකුණු 2)
   ii. "සබ්බේ සංඛාරා අනිච්ඡා" විමසන්න. (ලකුණු 4)
   iii. "බුදු දහම දේව කේන්ද්‍රිය නොවේ" විස්තර කරන්න. (ලකුණු 6)
   iv. කුසලාකුසල මිනුම් දඬු සනිදර්ශනව පැහැදිලි කරන්න. (ලකුණු 8)

3.
   i. ශ්‍රමණ සම්ප්‍රදායේ විමුක්ති මාර්ගය කුමක් ද? (ලකුණු 2)
   ii. "අප්පිච්ඡතා" යන්න හඳුන්වන්න. (ලකුණු 4)
   iii. ශ්‍රාවකයන් ධර්ම ප්‍රචාරයේ උනන්දු කරවීමට බුදුරජාණන් වහන්සේ ගත් ක්‍රියා මාර්ග අගයන්න. (ලකුණු 6)
   iv. "මහණෙනි වර්ෂා කාලයේ වස් විසීමට අනුදැන වදාරමි" විමසන්න. (ලකුණු 8)

II කොටස

4.
   i. තෙවන ධර්ම සංගායනාවට බලපෑ හේතු සමාලෝචනය කරන්න. (ලකුණු 8)
   ii. සාසනයේ චිර පැවැත්මට සංගායනා මගින් සිදු වූ සේවාවන් විස්තර කරන්න. (ලකුණු 12)

5.
   i. කර්මය පිළිබඳ ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් සැකෙවින් පෙන්වා දෙන්න. (ලකුණු 8)
   ii. බුදු දහමේ කර්මය හා පුනර්භවය අතර ඇති සම්බන්ධය පෙන්වා දෙන්න. (ලකුණු 12)

6.
   i. "සන්තානගත දුක" ගොඩනැගෙන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 8)
   ii. මධ්‍යම ප්‍රතිපදාවක් ලෙස නිවන් මග පැහැදිලි කරන්න. (ලකුණු 12)

7.
   i. බුදු දහමේ ධනය පිළිබඳ ආකල්පය විස්තර කරන්න. (ලකුණු 8)
   ii. මනා කළමනාකරණයකින් ධනය පරිභෝජනය කළ යුතුය. විමසන්න. (ලකුණු 12)

8.
   i. දැහැමි රාජ්‍ය පාලනය යනු කුමක්දැ යි පහදන්න. (ලකුණු 8)
   ii. රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වලින් නූතන ලෝකයට ලබාගත හැකි ආලෝකය විමසන්න. (ලකුණු 12)

* * *

අ.පො.ස උසස්පෙළ විෂයයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් සඳහා Past Papers Wiki සමඟ එක්වෙන්න